ස්වාධීන සහ ජාතික රූපවාහිනී තුළ පමණක් පළවී ඇති හඬපට

කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේදී ජූනි 08, 2022 දින විභාගයට ගැනුණු ගාලුමුවදොර සහ අරලියගහ මන්දිරය ඉදිරිපිට සිදුවීම් පිළිබඳ නඩු විභාගයේදී, පසුගියදා කොටුව මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරිපිටදීම සැකකරුවන් රිමාන්ඩ් කිරීමට බන්ධනාගාර බසයෙන් රැගෙන යන මොහොතේ සිදුවූ විරෝධතාවයන් පසුපස ඇති කුමන්ත්‍රණයක් පිළිබඳ අනාවරණය වූ බව, ජූනි 08, 2022 ජාතික රූපවාහිනී සහ ස්වාධීන රූපවාහිනී රාත්‍රී ප්‍රධාන සිංහල පුවත් විකාශය පවසයි. ඒ සම්බන්ධයෙන් ඇතැයි පවසන හඬ පටයක් පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක සොලිසිටර් ජනරාල් අයේශා ජිනසේන අධිකරණයට කරුණු වාර්තා කළ බවද වැඩිදුරටත් පවසන එම පුවත් විකාශයන්, එම "සැඟවෙන්නට ගිය කරුණු" ඇතුළත් බව පැවසෙන හඬ පටයද විකාශය කරයි.

කෙසේ නමුත්, ජාතික රූපවාහිනී සහ ස්වාධීන රූපවාහිනී හැරෙන්නට එදින වෙනත් රාත්‍රී ප්‍රධාන පුවත් විකාශයක මේ සම්බන්ධයෙන් වාර්තා වී නොතිබිණි.

මේ පිළිබඳ ඔබේ අදහස කුමක්ද?

(මෙම දත්ත සටහන සඳහා භාවිතා වී ඇත්තේ ජූනි 08, 2022 දින රූපවාහිනී රාත්‍රී ප්‍රධාන සිංහල පුවත් විකාශයන් පමණක් වන අතර, එදින වෙනත් වේලාවන් හි විකාශය වූ පුවත් තුළ මීට වෙනස් දත්ත ඇතුලත් විය හැක.)